# කෘෂිකර්ම අමාත්‍යාංශය

# කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවාගැනීම (කොළඹ)

කුඩා ඉඩම් හිමි ගොවින්ට තරගකාරී සහ වෙළඳපොලට ඉදිරිපත් කළ හැකි වෙළඳ ද්‍රව්‍ය නිපදවීමට සහායවීම සහ අවශ්‍යතා වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, ඔවුන්ගේ හැකියාව වැඩිදියුණු කිරීමට සහ වැඩිකළ වාණිජකරණයක් දෙසට යොමුවීම සඳහා වන දේශීය හවුල්කාරිත්ව මූලෝපායට (CPS) අනුකූලව ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය සමග කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාවෙන් ඉතිරිව ඇති කාලසීමාව වසර 2 ක් පමණවන අතර, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 64.23 කි.

කොළඹ පිහිටි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පහත සඳහන් තනතුර සඳහා මතු දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අභ්‍යන්තර විගණක (PS-4) - තනතුරු 01

- **අවශ්‍ය සුදුසුකම්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව නිමා කිරීම

හෝ

I. අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන සුදුසුකම්

හෝ

II. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / එවැනි වෘත්තීය ආයතනයක් වෙතින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම්

සමග

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 7 ක සුදුසුකම් ලැබීමෙන් පසු පළපුරුද්ද.

02. රජයේ දීපව්‍යාප්ත සේවයක III/II පන්තියේ නිලධාරියෙකුවීම හෝ අදාළ ක්ෂේත්‍රයේ ඉහළ හෝ සමාන තත්ත්වයක්

සමග

III/II පන්තියේ තනතුරක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 64 ට නොවැඩි විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කෙරෙණ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය :**

වැටුප 2019.03.05 වන දින අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම් වේ.

**සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

රජයේ සේවයට අයත් නිලධාරීන් ද්විතීයක පදනම මත බඳවාගනු ලබන අතර, රජයේ සේවයෙන් පරිබාහිර අයවළුන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. සෑම පත්වීමක්ම ආරම්භයේදී වසර එකක කාලසීමාවක් සඳහා සිදු කරනු ලබන අතර, සාර්ථක කාර්ය සාධනය මත සේවය දීර්ඝ කිරීම පදනම් වනු ඇත.

**අයදුම්පත් :**

සියලුම අයදුම්කරුවන් විසින් ස්වකීය ජීව දත්ත තොරතුරු සහිත අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපින ද සමග අදාළ සහතික පත්‍රවල පිටපත් ද සහිතව 2020 ඔක්තෝබර් මස 23 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. රජයේ සේවයේ / අර්ධ රාජ්‍ය සේවාවන්හි දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන්නේය.

- අයදුම් කරන තනතුර අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ පැහැදිලිව සටහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය,**
**(කෘෂිකර්ම අමාත්‍යාංශය),**
**නො. 288, ඩී පී ජේ ගොඩනැගිල්ල - 1 වන මහල,**
**ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.**

Source: Dinamina, Daily News (2020.10.09)